**තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය - 2015**

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පනතේ 8(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4. අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 අභිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු වටිනාකම රු.3,360,000 ක් වූ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,838,000 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කළ යුතු වුවත්, එය ප්‍රාග්ධනිත කර සමාලෝචිත වර්ෂය සඳහා රු.684,271 ක් ක්ෂය ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී දේපල පිරියත උපකරණවල ඇතුළත් වත්කම් පන්ති 05 කට අදාලව තෝරාගත් කොටසක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් සමස්ත වත්කම්වලට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත්කර තිබුණි. මේ අනුව මෑත වර්ෂවල මිලදී ගත් වත්කම් ගිණුම්වලින් අත්හැරී තිබූ අතර එම වත්කම්, ලේඛනගත නොවීම නිසා එහි ආරක්ෂාව ප්‍රශ්න ගතවනු ඇත.

(ඇ) අධිකාරිය විසින් පිරිවැය ආකෘතිය අනුව දේපළ පිරියත හා උපකරණ මිණුම්කරණය කරන බව අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිවල සඳහන් කර තිබුණද, දේපළ පිරියත හා උපකරණ පන්ති 05 ක පිරිවැය රු.18,409,588 ක් වූ වත්කම් ඒකක 1118 ක් ප්‍රත්‍යාගණන වටිනාකම වන රු.6,186,610 කට ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ස්වරූපයේ නොවන වාහන අමතර කොටස් සඳහා වැය කරන ලද රු.446,155 ක් ප්‍රාග්ධනිත කර තිබූ අතර ඒ මත ක්ෂයවීමද ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරය විසින් ප්‍රදානයක් ලෙස 2011 හා 2015 වර්ෂවලදී ලබාදී තිබූ පිරිවැය රු.17,135,000 ක් වූ වාහන 03 ක වටිනාකම ප්‍රදානයක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වත්කම්වල සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.6,835,374 ක් වුවද ඒ සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) විපතට පත් වූ දේපල යථාවත් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.63,000,000 ක ප්‍රදාන මුදලක් අදාල පාර්ශව වෙත නිදහස් කිරීමේදී එය වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද එසේ ගෙවූ මුදල් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් යටතේ ඒකාබද්ධ ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැලසීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද නැවත භාණ්ඩාගාරයට පියවිය යුතු රු.738,544,380 ක මුදල සනාථ කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස රු.1,637,949 ක ශේෂයක් පෙන්නුම් කළද එදිනට මුදල් පොතට අනුව රු.38,095,925 ක ශේෂයක්ද, ඉතිරිකිරීමේ ගිණුමේ රු.96,969,400 ක්ද තිබීමෙන් මුදල් හා මුදල් සමාන දෑ අතර රු.133,427,376 ක වෙනසක් නිරීක්ෂණය වු අතර, එදිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පසු ගිය මාසය තුළ අංක 74757297 ගිණුමට මාරු කිරීම ලෙස පෙන්නුම් කර තිබූ රු.133,839,840 ක් අනාවරණය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

### 2.2.5 ලැබිය යුතු ගිණුම්

1983 ජුලි කලබල හේතුවෙන් ලංකා බැංකුව මඟින් ලබාදෙන ලද වාණිජ ණය සමාලෝචිත වර්ෂය සඳහා අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 2.21 ක තරම් මන්දගාමී මට්ටමක පැවති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.4,375,312 කි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 381(I) | බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඉතිරි කිරීමේ ගිණුමක් විවෘත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.96,969,400 ක්ව පැවතුණි. |
| (ආ) 2009 නොවැම්බර් 18 දිනැති අංක 15/2007(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | නිවාස ණය සඳහා ණය මුදල මත පදනම්ව පොළී අයකළ යුතු වුවත් සියයට 4.2 ක පොළී අනුපාතයක් අයකිරීමට 2015 දෙසැම්බර් 11 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කිරීම හා අධිකාරියේ අරමුදල් භාවිතා කොට කාර්ය මණ්ඩලයේ නිලධාරින් 17 දෙනෙකු සඳහා එකතුව රු.12,467,950 ක නිවාස ණය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ලබාදී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,663,242 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.119,261,814 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.47,598,572 කින් අඩුවී තිබුණි. රජයේ ප්‍රදාන රු.86,653,000 කින් වැඩිවී තිබීම ඉහත ඌනතාවයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 හා 2013 වර්ෂවලදී මෙහෙයුම් අතිරික්තයක් තිබුණද 2012, 2014 හා 2015 වර්ෂවලදී ඌනතාවයක් ඇති වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.86,653,000 කින් වැඩි වී තිබූ නමුත් 2015 දී සැලකිය යුතු ඌනතාවයක් සිදු වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම් කිරීමෙන් පසුව වුවද 2014 හා 2015 වර්ෂවල දායකත්ව සෘණ වටිනාකම පිළිවෙලින් රු.80,600,892 ක් හා රු.20,433,541 ක් විය. මේ අනුව අධිකාරිය මූල්‍යමය වශයෙන් පිරිහීමක් පෙන්නුම් කළද එම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

(අ) 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ පනතේ විධිවිධානයන්ට අනුව අධිකාරියේ ප්‍රධාන කර්තව්‍ය පහත සඳහන් පරිදි වේ.

(i) හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර කිරීම.

(ii) යම් හානියට පත් දේපලක අයිතිකරුවකුට හෝ කුලී නිවැසියාට එම දේපල අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආධාර කිරීම.

(iii) ගොඩනැගිල්ලකින් හෝ ව්‍යුහයකින් යුක්ත වන යම් හානියට පත් දේපලක් කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස නියෝග කිරීම.

(iv) යම් හානියට පත් කර්මාන්තයක හෝ ව්‍යාපාරයක අයිතිකරුවකුට, පුනරුත්ථාපන අධිකාරිය විසින් එකඟත්වයකට පැමිණෙන යම් සාධාරණ කොන්දේසියකට යටත්ව එම කර්මාන්තය හෝ ව්‍යාපාරය පුනරුත්ථාපනය කිරීම සඳහා ඔහුට ආධාර කිරීම සහ එම පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා දරන ලද යම් වියදමක් එම අයිතිකරුට ආපසු ගෙවීම.

(ආ) 2010 අගෝස්තු 19 හා 2012 මාර්තු 15 දිනයන්හි අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව පහත කාර්යයන් අදාල වේ.

(i) සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා ණය පහසුකම් සැලසීම.

(ii) ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් පීඩාවට පත් පවුල් වෙනුවෙන් සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

(ඇ) විපතට පත් වූවන් හට ණය ලබාදීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් වලින් බැංකු හා මුල්‍ය ආයතන වල ආයෝජනය කිරීමෙන් ලද රු.162,224,943 ක පොලිය ඉතිරි කිරීමේ ගිණුමට මාරුකර තිබුණ අතර එයින් රු.11,683,192 ක මුදලක් ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය පවත්වාගෙන ගිය පැරණි කාර්යාල ගොඩනැගිල්ලෙන් ඉවත්වී වසර 2 කට වැඩි කාලයක් ගතවී තිබුණද, බදු කුලී වෙනුවෙන් ගෙවා තිබූ රු.475,000 ක තැන්පතුව කුලී හිමියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 24 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ රු.3,360,000 කට අධිකාරිය සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම පද්ධතිය ක්‍රියාත්මකව නොපැවතුණි.

(ඇ) කම්කරු විනිශ්චයාධිකාර අංක 13/40/2009 දරන නඩුවේදී අධිකාරිය විසින් ආයතනයට වාසිදායක වන ආකාරයෙන් කරුණු ඉදිරිපත් කර නොතිබුණු අතර වැදගත් සාක්ෂි ද ලබාදී නොතිබුණි.

(ඈ) ත්‍රස්තවාදී ක්‍රියා/ ජාතිවාදී අරගල හේතුකොටගෙන දැඩි ලෙස විපතට පත් වූ රජයේ ලියාපදිංචි කර්මාන්ත පුනරුත්ථාපනය වෙනුවෙන් ණය ලබා දීම සම්බන්ධයෙන් වූ 1996 ජූනි 23 දිනැති අංක ආර්පී/1/එල්ඕඒඑන්/2/96 දරන ආයතන චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව 2008 වර්ෂයේ "ගංවතුර" හේතුවෙන් විපතට පත් වූ කර්මාන්තයක් වෙනුවෙන් ගෙවීම සඳහා 2014 දෙසැම්බර් 10 දින නිර්දේශ කර රු.5,000,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

ජීවිත හා දේපල හානියටපත් තැනැත්තන් සඳහා සහන පොළිය යටතේ විවිධ ආයතන හරහා ණය පහසුකම් සලසා දීමට අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් ආපසු ගෙවීමේ පදනම මත අධිකාරිය වෙත ලබා දී තිබුණි. මෙම පදනම මත නිවාස සංවර්ධන අධිකාරියට ලබා දුන් ණය කාල සීමාව ඉක්මවා තිබියදී රු. 119,715,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතුව තිබුණි. මෙසේ සපයන ලද මුදල වෙනුවෙන් අධිකාරිය වෙත ලැබිය යුතු පොළිය රු. 39,996,461 ක් වූ නමුත් එය ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර එම සම්පූර්ණ පොළිය පදනමකින් තොරව නොලැබේ යැයි සලකා බොල්ණය ලෙස වෙන්කර තිබුණි. මේ අනුව දීර්ඝ කාලයක් අයනොවී පවතින මුදල් අයකිරීම කෙරෙහි අධිකාරිය විසින් අවධානය යොමු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

-----------------------

මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධානයන් හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණු අතර මුදල් පනතේ 13(5)(ඇ) ප්‍රකාරව විගණන වැඩසටහන් හෝ ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අයවැය ගත වියදම් තත්‍ය වියදම් සමග සැසඳීමේදී අයිතම 15 කට අදාළව සියයට 37 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ සුභසාධන වියදම් සඳහා අයවැය මගින් රු.500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද සත්‍ය වියදම රු.1,116,152 ක් වූයෙන් අධිවැය සියයට 123.23 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 42.36 ක වැඩිවීමකි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | වත්කම් සම්බන්ධ ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම හා වත්කම්වල අගයන් නිවැරදිව නිශ්චය නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත වියදම හා සත්‍ය වියදම අතර විශාල විචලනයන් පැවතීම. |
| (ඇ) | වන්දි හා ණය ගෙවීම් | පවතින චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව හා ප්‍රමාදයකින් තොරව වන්දි හා ණය නොගෙවීම. |
| (ඈ) | ගිණුම්කරණය | වියදම් වර්ගීකරණය, තොග ගණනය කිරීම හා බැංකු සැසඳුම් පිළියෙල නොකිරීම. |